**ශීර්ෂ 315 - උතුරු පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය**

---

## 1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

### 1.1 දැක්ම

උතුරු පළාත් ජනතාවගේ අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීම සඳහා විධිමත් යහ පාලනය තුළින් තිරසාර සංවර්ධනය සමඟ සෞභාග්‍ය ළඟාකර ගැනීම සඳහා වූ අරමුණ.

### 1.2 මෙහෙවර

යටිතල පහසුකම් පුනරුත්තාපනය කිරීම තුළින් සේවා හා පහසුකම් යලි පනගන්වමින් ජීවනෝපාය නැවත ස්ථාපිත කිරීම සහ උතුරු පළාත් ජනතාව ඉලක්ක කර ගනිමින් මානව සම්පත් ධාරිතාව සංවර්ධනය කිරීම.

### 1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

උතුරු පළාත් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.20,550,777,000 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.16,415,232,281 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.4,135,544,719 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක් ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 14,591,000,000 | 12,642,000,000 | 1,949,000,000 | 13 |
| මූලධන | 5,959,777,000 | 3,773,232,281 | 2,186,544,719 | 36 |
| එකතුව | 20,550,777,000 | 16,415,232,281 | 4,135,544,719 | 20 |

මධ්‍යම රජය විසින් ලබා දී තිබුණු ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ උපයෝජනය කර තිබුණු අතර පළාත් සභාවේ අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.